සංස්කරණය/Editor
අසෝක සුබසිංහ Asoka Subasinghe

උපදේශක සංස්කාරක
ජගත් ජේ එදිරිසිංහ Jagath J Edirisinghe

සංස්කරණ සහය/Asst. Editors
ශ්‍රීනාත් මද්දුමගේ Srinath Maddumage

ක්‍රීඩා සංස්කාරක
අසෝක සිල්වා Asoka Silva

සන්නස පිරිවර

සිසිර දිසානායක
වි ක ධර්මබන්ධු
ආචාර්ය විද්‍යානි මනතුංග
ශ්‍රියාණි මද්දුමගේ
චන්දි මාපා
මහින්ද දිසානායක දිවුල්ගනේ
ශ්‍රියා කුමාරසිංහ
මේනකා ජයතිලක

සේයා රූ
ප්‍රසන්න නාමල් කුරුකුලරත්න

පිටු සැකසුම සහ ග්‍රැෆික් නිර්මාණ
Page Layout & Graphic Designs
සාමන්ත තැන්නගේ Saamantha Tennege

සමබන්ධීකරණය



| | |
|---|---|
| NSW | WA |
| Lakshman Kodituwakku | Kapila Hemantha |
| 02 9626 7660 | Balage |
| 02 9837 5055 | 08 9456 1972 |
| QLD | ACT |
| Ananda Samaratunga | Asoka Nimalasiri |
| 07 3372 7953 | 0400 429 031 |
| SA | TAS |
| Chandra Eeriyagama | Anura Seneviratne |
| 08 8331 2318 | 03 6327 4259 |

Sannasa
61 Nettle Drive
Hallam Vic 3803 Australia
Web: www.sannasa.net
email : sannasanews@gmail.com
Tel/Fax : 03 9796 4241


පුවත්පතේ පලවන ලිපිවල අන්තර්ගතය ඒ ඒ ලේඛකයා/ලේඛිකාව ගේ අදහස් වන අතර ඒවායින් සංස්කාරකවරුන්ගේ අදහස් පිළිබිඹු නොවන බව සලකන්න සන්නස නව සහශ්‍රයට පුවත්පතින් උපුටාගත් බව සඳහන් කරමින් ඒවා උපුටා දැක්වීමට අවසර ඇත.

CIRCULATION - 10000 COPIES IN AUSTRALIA

## සංස්කාරක සටහන

නව සහශ්‍රයට සන්නස පුවත්පත විවෘත වේදිකාවකි. මෙහි පළවන ලිපි වල අන්තර්ගත වන්නේ එම ලිපි ලියන ලේඛකයනගේ අදහස් ය. ඒ ලිපි තුළින් කතා බහ කෙරෙන කාරණා පිළිබඳව ඔබට ද මතයක් ඇත්නම් ඔබේ අදහසට ද ඉඩක් ලබා දෙන්නට අපි සැමවිටම උත්සාහ කරන්නෙමු. ඔබේ ලිපිය ඉතා කෙටියෙන් ලියන්න. පුවත් පතේ ඉඩ, අදහස නිරවුල් ව ඉදිරිපත් නොකිරීම, වැරදි භාෂාව, වැනි හේතු මත සියලුම ලිපි සංස්කරණයට භාජනය විය හැකි බව සළකන්න.

## කාන්තා දිනය

අපේ සමාජය තුළ ජීවත් වන කාන්තාවෝ තමන් කාන්තාවන් වීම නිසාම මුහුණ දෙන ප්‍රශ්න වලින් පීඩා විඳිති. සමාජය තුළ , පවුල තුළ , සමාජ ආකල්ප මත වාද තුළ , ඇය අසාධාරණයට ලක් වන අවස්ථා බොහෝ තිබේ. තමන් මුහුණ දෙන ප්‍රශ්න ස්වාභාවික හා පරපුරෙන් පරපුරට පවතින, වෙනස් කළ නොහැකි දේ ලෙස අර්ථ ගන්වා එම අසාධාරණයන් ඉවසා දරා සිටීමට ඇයව හැඩ ගස්වා තබන්නට සමාජය පුරුදු වී තිබේ.

මේ අසාධාරණයට එරෙහි වන කාන්තාවන් ඉඳ හිට දක්නට ලැබුණ ද සමස්ථ කාන්තා පරපුරේ පොදු ඉරණම බවට අද මෙය පත්ව ඇත. මේ ඉරණමින් ඇය මුදවාගැනීම පිණිස ඇය වෙනුවෙන් කැප වනු පිණිස සැම වසරකම දිනයක් ඇය වෙනුවෙන් වෙන් කර තිබේ. මාර්තු 8 වන දා වන මේ දිනය දේශීය හා විදේශීය විවිධ රාජ්‍ය නොවන සංවිධාන වලට හා විවිධ දේශපාලන පක්ෂ වලට තම තමන්ගේ ව්‍යාපෘති දියත් කර ගැනීමේ දිනයක් පමණක් වීම කොයි තරම් අභාග්‍යයක් ද?

සැම මාර්තු 8 වනදා උත්සවාකාරයෙන් ඇරඹෙන සාකච්ඡා සම්මන්ත්‍රණ නැටුම් ගැයුම් සියල්ලම එදිනට පසු අකර්මන්‍ය වීම කාන්තාවනගේ පමණක් නොව සමස්ථ සමාජයේම අභාග්‍යයක් නොවේ ද? ඒ අභාග්‍යයේ තරම කොතරම් දැයි සමාජය තුළ දූෂනයට ලක්වන, හිංසාවට ලක්වන, ලිංගික අපචාරයනට ලක්වන, සූරා කෑමට ලක්වන, බන්ධනාගාර ගතවන, නීති විරෝධී ගබ්සා වලින් මිය යන, කාන්තාවනගේ සංඛ්‍යා ලේඛණ වලින් තේරුම් ගත හැකි ය. කාන්තාවනගේ අයිතීන් වෙනුවෙන් කෑ මොර දෙන කිසිවකු ඇය වෙනුවෙන් අවංකව පෙනී සිටින්නේ නැතැයි අප කියන්නේ ඒ නිසා ය.

කාන්තාවන්ගේ අයිතිවාසිකම් වෙනුවෙන් සකස් වුණ එක්සත් ජාතීන්ගේ ප්‍රඥප්තිය සම්මත වී වසර 31 ක් ගත වුව ද අපේ කාන්තාවන් ලබා ඇති ප්‍රගතිය පිළිබඳව සතුටු විය හැකි ද? කාන්තා සුබසාධනය හා අයිතිවාසිකම් වෙනුවෙන්, වචන හා සැරසිලි වලින් බැහැරට ගිය, සැබෑ ක්‍රියාදාමයක අවශ්‍යතාව අද සමාජයට තදින් දැනිය යුතු ය.

# කොටි සුද්ද කිරීම ද? ඇත්ත කියා පෑම ද?

**මහාචාර්ය සිසිර ජයසූරිය තවත් එඩිතර ප්‍රකාශයක් කර ඇත. මේ රටේ මෙන් බහු සංස්කෘතික සමාජයක දෙමළ ජනතාව ජීවත් විය යුතු බවක් කිසිම සිංහලයන් බහුල රජයකින් නොපිළිගැනුණු බව ය, ඒ. එසේ කියන එතුමාට අමතක වූ කරුණක් මෙල්බර්න් නිදහස් දින උළෙලේදී ශ්‍රී ලංකා මහ කොමසාරිස් විසින් පෙන්වා දෙනු ලැබී ය. ශ්‍රී ලංකාවේ දෙමළ ජනතාවගෙන් බහුතරයක් ඊනියා දෙමළ නිජබිම වශයෙන් සැළකෙන උතුරු නැගෙනහිර පළාත් වලින් පිටත සිංහල අඩවියේ වාසය කරන බව ය, ඒ. ඔහු නොකී තවත් වැදගත් කරුණක් ඇත. එනම් ශ්‍රී ලංකාවේ දෙමළ ජනයාට රටේ කවර පෙදෙසක වුවත් ජීවත් වීමට ඉඩ ඇති නමුත්, උතුර සපුරා සුද්ද කළ කොටි සිංහල, මුස්ලිම් දෙවර්ගයම ඒ පෙදෙසෙන් පලවා හරින ලද බව ය, ඒ.**



## ඩී. බී. කුරුප්පු

ශ්‍රී ලංකාවේ වර්තමාන තත්ත්වයට වගකිව යුත්තේ එල්.ටී.ටී.ඊ ය යයි ඉන්දියාවේ ස්වදේශීය කටයුතු පිළිබඳ ඇමති පී.චිදම්බරම් ප්‍රකාශ කළ බව පසුගිය දා වාර්තා විය. ඔහු විසින් කොටි සංවිධානය කළ වීර ක්‍රියාවක් ද සඳහන් කරන ලදී. ඒ දෙමළ නායකයන් ඝාතනය කිරීමය. එසේ ඝාතනයට ලක් වූ නායකයන් සියළු දෙනාම වාගේ දෙමළ ජනතාවගේ ගෞරවාදරයට පාත්‍ර වූ ජනතා නියෝජිතයින් වූ බව ද කිව යුතුය. කොටින්ගේ මරු පහරට ගොදුරු නොවූ නායකයන් අතර ප්‍රධාන ස්ථානයක් ගන්නේ කිහිප වතාවක්ම දෙමළ ජනයාගේ නිදහස් ඡන්දයෙන් පාර්ලිමේන්තුවට තේරී පත් වූ ආනන්ද සංගරී ය. ඔහුටත් ලක්ෂ්මන් කදිරගාමර්ට කළ දේම කරන්නට කොටින්ට වුවමනා බව රහසක් ද නොවේ.

වෙනුවෙන් කැප වී සිටින කොටි හිතවතකු වන නොර්වේ දේශයේ එරික් සොල්හයිම් ඇතුළු විවිධ රාජ්‍ය නොවන සංවිධාන ද මෙම වගකීම කරට ගෙන ඇත. එබඳු සංවිධාන විසින් මාධ්‍යවේදීන් සඳහා තිඹිරිගස්යායේ හෝටලයක පවත්වන ලද භෝජන සංග්‍රහයකින් පසු තමන් ගැන වාර්තා කිරීමේදී පිළිපැදිය යුතු කරුණු පහදා දී, අවසානයේ සහභාගී වූවන් එකිනෙකා දස දහසින් බැඳි පියල්ලෙන් පුදන ලද බවත් පසුගිය දා වාර්තා විය.

දෙමළ ජනතාවගේ සැබෑ නියෝජනයක් පාර්ලිමේන්තුව තුළ ඇති වන්නට නම් කොටි සංවිධානය පරාජයට පත් කළ යුතු බව ය, ආනන්ද සංගරී කියන්නේ. කොටි දෙමළ ජනතාවගේ නායකයන් වශයෙන් නොපිළිගත යුතු බව ඔහු අවධාරණය කරන්නේ ය.

එහෙත් කොටි වෙනුවෙන් කතා කිරීමටත් නියෝජිත පිරිසක් සිටිති. ඒ නිදහස් ඡන්දයකින් නොව කොටින්ගේ පිහිටෙන් පාර්ලිමේන්තුවට ආ දෙමළ ජාතික සංවිධානයේ මන්ත්‍රීවරු ය. ඔවුන්ට පැවරී ඇත්තේ කොටි සුද්ද කිරීමේ කාර්ය භාරය යි.

මේ කියන සුද්ද කිරීම අතින් කරන්නක් නොවේ. කටින් කරන්නකි. කටින් මවා පෑමකි. කොටින්ම කොටින්ට සුදු හුණු ගෑමේ බරපතල රාජකාරියයි. කොටි අතකොලු බවට පත් වූ ඒ මන්ත්‍රීන් හැරෙන්නට විදේශගත පිරිස් ද එම රාජකාරියට අත ගසන්නෝ ය. ලෝක සාමය

එක්කෝ සොල්හයිම් ගේ වියදමෙන්, නැතහොත් වෙනත් නොර්වේ සංවිධානයකින් යැපෙන සුපිරි ශ්‍රී ලාංකිකයෙක් ද වරින් වර දිවයිනට වැඩම කර සාම දේශනා පවත්වන්නේ ය. හැත්තෑව දශකයේ හොරගෙ ාල්ල වලව්වේ අනුග්‍රහය ලත් ඔහු අද නොර්වේ දේශයේ ආශිර්වාදය නොඅඩුව ලබන ආචාර්ය කුමාර් රූපසිංහ ය. ඔහු කරන මුසා දේශනා ජනාධිපතිගේ අතටම අසු වූ බව ද සැල විය.

ඒ විදියේ සාම නියෝජිතයෙකුගෙන් නොව තමාගේ වෘත්තියෙන්ම යැපෙන ශ්‍රී ලාංකිකයෙක් අප අතරම වාසය කරන්නේ ය. ඔහු කොටි සුද්ද කරන්නට ඉදිරිපත් වූයේ අන් කිසිවකුගේ වුවමනාවට නොව සිය කැමැත්තෙන්ම බව පෙනෙයි. මෙල්බර්න් සරසවියක අර්ථ ශාස්ත්‍රය උගන්වන ඔහු නමින් මහාචාර්ය සිසිර ජයසූරියයි. මේ රටේ දී තමාගේ අදහස් නොබා ඉදිරිපත් කළ හැකි හෙයින් ඔහුගේ ප්‍රකාශ ගැන කිසිවකුට වරදක් කිව නොහැකිය. එසේ වුවත්, කොටින්ගෙ පරාජය විදේශයන්හි පාලකයන් පමණක් නොව කොටි හිතවතුන් ද පිළිගන්නා අවස්ථ ාවක සිසිර ජයසූරිය කොටි සුද්ද කරන්නට ඉදිරිපත් වූයේ ඇයි ද යන ප්‍රශ්නය නම් නැගිය යුතුම ය. පුද්ගලික ලාභයක් පතා නොවන බව නම් ඔහුට කරන ගෞරවයක් වශයෙන් පිළිගැනීමටත් සිදු වෙයි.

දෙමළ ජනතාවට වෙනම රාජ්‍යයක් තිබිය යුතු යයි කීමට ද ඔහු නොසිතන බව පෙනෙයි. එහෙත් ඔවුනට 1956 සිට සිදු වූ අසාධාරණ නැති කරලීමේ අයිතිය නොහොත් වගකීම කොටි සංවිධානයට පවැරීම ඔහු කරන ලොකු වරදකැයි සිතමි. කොටි සංවිධානය දෙසත්, ප්‍රභාකරන් දෙසත් ඊට සපුරා වෙනස් බැල්මක් හෙළන දෙමළ ජාතිකයෙක් වසර දෙකකට උඩ දී මට මුණ ගැසුණේ ය. මලයාසියාවේ සිට මේ රටට සංක්‍රමණය වූ ඔහු, මා මවිතයට පත් කළේ වෙනත් බොහෝ දෙමළ ජාතිකයන් පරිදි ප්‍රභාකරන් විවේචනය කිරීමට පසුබට නොවූ නිසා ය. කොටි නායකයා ඒ රටට පැමිණි විටක දැක ඇති බව කී ඔහු ඒ නායකයා පිනැං

9 වන පිටුවට